රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙම නියෝගය මඟින් මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම අනුරූපී භාණ්ඩයක් මතම, ඉහත පනතේ 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2019 මැයි මස 13 දිනැති අංක 2123/5 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය, 2019 ජූලි මස 10 දිනැති අංක 2131/29 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය, 2019 ඔක්තෝබර් මස 14 දිනැති අංක 2145/12 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය සහ 2019 දෙසැම්බර් මස 01 දිනැති අංක 2151/60 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත 2019 මාර්තු මස 05 දිනැති අංක 2113/9 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ I වන උපලේඛනයෙහි අනුරූප භාණ්ඩ මත එම උපලේඛනයේ IV වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණයන් සඳහා, මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2021 නොවැම්බර් මස ….13…. දින සිට ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 නොවැම්බර් මස ……4… වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>*I* | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>*II* | විස්තරය<br>*(III)* | නිෂ්පාදන බද්ද<br>*(IV)* |
|---|---|---|---|
| **24.02** | | **දුම්කොළ වලින් හෝ දුම්කොළ ආදේශක වලින් නිෂ්පාදිත සුරුට්ටු, කට තබන පැත්ත උල්වූ සුරුට්ටු, සිගාරිලෝස් සහ සිගරැට්.** | |
| | 2402.20 | දුම්කොළ අඩංගු සිගරැට්: | |
| | 2402.20.20 | දිග මි.මී. 60 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 6,750/- |
| | 2402.20.30 | දිග මි.මී. 60 ට වැඩි නමුත් දිග මි.මී. 67 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 28,850/- |
| | 2402.20.40 | දිග මි.මී. 67 ට වැඩි නමුත් දිග මි.මී. 72 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 41,100/- |
| | 2402.20.50 | දිග මි.මී. 72 ට වැඩි නමුත් දිග මි.මී. 84 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 46,600/- |
| | 2402.20.60 | දිග මි.මී. 84 ට වැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 51,800/- |